# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2391/26 - 2024 ජූලි මස 03 වැනි බදාදා - 2024.07.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම් පත්තුව සුළු කොට්ඨාසයේ රිදියගම ග්‍රාම නිලධාරි වසමේ ගොඩ කොග්ගල ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ අ.ග.පි. 564 අතිරේක අංක 30 පත්‍ර අංක 28 හි කැබලි අංක 387 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක් 0.1536 ක් වූ ඉඩම් කැබැල්ල,

01. **කැබලි අංක 387**

ඉඩමේ නම: බංගලා ගොඩැල්ල, කොග්ගල බැද්ද, කොග්ගල කැළේ; ඉඩමේ විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අම්බලන්තොට ප්‍රාදේශීය සභාව; ප්‍රමාණය: හෙක්. 0.1536.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනා තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 ජූලි මස 29 දින පෙ.ව. 10.30 ට අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024 ජූලි මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයෙන්, එකී ඉඩම/පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තර ද වන්දි මුදල හා ඒ ණය මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**එන්.ඩී.පී.රණසිංහ,**
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්තොට.

2024 ජූලි මස 01 වැනි දින,
අම්බලන්තොට,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

EOG 07 - 0026

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත් කර ගැනීමේ සංශෝධන පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 146, පුහුල් යාය, ග්‍රාම නිලධාරි වසමේ තවාළුවිල ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ කැඩැස්තර සිතියම් අංක 830224 හි කලාප අංක 01 හි පත්‍ර අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්.0.0304 ක් වූ ඉඩම් කැබලි.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: කච්චේරිය වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවු.02 ක් පමණ වයසැති පොල් ගසක්, අවු. 02 ක් පමණ වයසැති දෙහි ගසක් සහ තාවකාලික වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කරන්දෙණිය මහදුරගේ මල්ලිකා; ප්‍රමාණය: හෙක්. 0.0082.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: කච්චේරිය වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවු.05 ක් පමණ වයසැති පොල් ගස් 04ක් සහ තාවකාලික වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කරන්දෙණිය මහදුරගේ මල්ලිකා; ප්‍රමාණය: හෙක්. 0.0130.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: කච්චේරිය වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත සහ තාවකාලික වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කරන්දෙණිය මහදුරගේ කමලාවතී; ප්‍රමාණය: හෙක්. 0.0046.

04. **කැබලි අංක 04**
ඉඩමේ නම: කච්චේරිය වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත සහ තාවකාලික වගාවක් ඇත; හිමිකම් කියන අය: කරන්දෙණිය මහදුරගේ කමලාවතී; මුල් හිමිකම් කියන අය: කරන්දෙණිය මහදුරගේ කමලාවතී; ප්‍රමාණය: හෙක්. 0.0015.

05. **කැබලි අංක 05**
ඉඩමේ නම: කච්චේරිය වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත සහ තාවකාලික වගාවක් ඇත; හිමිකම් කියන අය: කරන්දෙණිය ශාමිලා ශ්‍රිවන්ති; මුල් හිමිකම් කියන අය: කරන්දෙණිය ශාමිලා ශ්‍රිවන්ති; ප්‍රමාණය: හෙක්. 0.0031.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2024 අගෝස්තු මස 05 වැනි දින පෙ.ව. 10.00 ට අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2024 ජූලි මස 19 දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තර ද වන්දි මුදල හා ඒණය මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**එන්.ඩී.පී.රණසිංහ,**
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්තොට.

2024 ජූලි මස 02 වැනි දින,
අම්බලන්තොට,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

EOG 07 - 0027

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2104/32 හා 2019.01.04 දින දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරනලද ඉඩම් අත්කරගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ දැන්වීමේ 5A පිටුවේ දැක්වෙන අංක 520001-20-31 හා 2018.01.26 දරන කැඩැස්තර සිතියමේ කැබලි අංක 424 හා 427 හි ප්‍රමාණය සර්වේ ජනරාල්ගේ අංක CO/HMG/2022/166 හා 2024.02.07 දින දරන අනුරේඛණයට අනුව පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

01. **කැබලි අංක 424**
ප්‍රමාණය හෙක්ටයාර 0.0112

02. **කැබලි අංක 427**
ප්‍රමාණය හෙක්ටයාර 0.0017

**බී. ඒ. ඩී. චින්තක,**
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2024 ජූලි මස 02 දින,
හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

EOG 07 - 0028

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.